# ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලියට අණපනත්, රෙගුලාසි අදාළ වාර්තා හා ලේඛන බ්‍රේල් මුද්‍රණයෙන් නිකුත්වේ.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය, තම සංවිධානය ඇරඹූ දින පටන් ම මැතිවරණ නිරීක්ෂණයට අමතරව මෙරටේ මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයට ද තම ක්‍රියාකාරී සහයෝගය දක්වමින් සිටී. එහිලා CMEV ආයතනය, ආන්තීකරණයට ලක්වූ ජන කණ්ඩාම්හී (Marginalised and Vulnerable Groups) ඡන්ද අයිතිය සුරැකීමෙහිලා සුවිශේෂී දායකත්වයක් දක්වා ඇත.

එකී ක්‍රියාදාමයේ වඩාත් තීරණාත්මක අවස්ථාවක් වූයේ පසුගිය වසරේ පැවැත් වූ ප්‍රධානතම මැතිවරණ දෙකේ දී CMEV ආයතනය, ආබාධ සහිත පුද්ගලයන්ගේ දේශපාලන අයිතිවාසිකම් සුරැකීම සඳහා පෙරමුණ ගැනීමයි.  එහිලා දක්වන ලද කැපී පෙනෙන දායකත්වය වූයේ "සබල මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය" (Enabled Elections) හා එක්ව ආබාධ සහිත පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම සඳහා පියවර ගැනීමයි. "සබල මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය" (Enabled Elections)  යනු ස්වෙච්ඡා ක්‍රියාකාරීන් ඇතුළු ව ආබාධ සහිත ජනතාවගේ අයිතීන් උදෙසා පෙනී සිටින සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමකි. එකී කණ්ඩායම මෙන්ම එවකට පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව හා එක්ව CMEV ආයතනය, දිවයින පුරා දැනුම්වත් කිරීමේ හමු සංවිධානය කරමින් හා ඔවුන් තම ඡන්දය භාවිතා කිරීමේ දී මුහුණ දෙන ගැටළු අවම කිරීම සඳහා සුවිශේෂී මැදිහත්වීම් රාශියක් සිදුකරන ලදී. එවකට මැතිවරණ කොමසාරිස්වරයා වූ මහින්ද දේශප්‍රිය මහතා ඒ වෙනුවෙන් දැක්වූ දායකත්වය අතිමහත්ය.

එපමණක් නොව CMEV ආයතනය, ජනාධිපතිවරණය හා මහ මැතිවරණය පැවති  සමය තුළ, ආබාධ සහිත තරුණ ක්‍රියාකාරීන් කෙටිකාලීන මැතිවරණ නිරීක්ෂකයන් වශයෙන් ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතු සඳහා යොදවන ලදි. ඊට අමතරව ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා ද ඔවුන්ගේ සේවය ලබා ගන්නා ලදි. මෑත කාලීනව CMEV ආයතනය, ගත් තවත් එක් පියවරක් වූයේ ආබාධිත ජනතාවගේ දේශපාලන අයිතවාසිකම් ව්‍යවස්ථාපිත අයිතීන් ලෙස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළට ඇතුළත් කළ යුතුය යන පණිවුඩය සමාජගත කිරීමයි. ඊට අදාළව අනෙකුත් සිවිල් සමාජ කණ්ඩායම් හා ක්‍රියාකාරීන් හා එක්ව "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නව ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව" වෙත යෝජනාවලියක් ඉදිරිපත් කරන ලදි. එසේ ඉදිරිපත් කරන ලද යෝජනා රාශියක් ඔවුන් විසින් සම්පාදිත අවසන් වාර්තාවේ අඩංගුව තිබීම අප ලද සාමූහික ජයග්‍රහණයකි.

CMEV ආයතනය, ආබාධිත පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය සුරැකීමෙහිලා තවත් පියවරක් තබා ඇත. එනම් මැතිවරණ කොමිෂන් සභාව සමග එක්ව ඡන්ද අයිතියට අදාළ ලේඛන පහසුවෙන් පරිශීලනය කළ හැකි ආකෘති අනුව සකසා බෙදා හැරීමයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ බල පවත්නා මැතිවරණ පනත් හා රෙගුලාසි බ්‍රේල් මාධ්‍යයෙන් ලබාදීම මේ අනුව සිදු කරනු ලබන අතර දැනටමත් 2016 වසරේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව මැතිවරණ කොමිෂන් සභාව විසින් සම්පාදිත තොරතුරු පත්‍රිකා බ්‍රේල් මුද්‍රණයෙන් සකසා ඇත. නුදුරේදී සියළු මැතිවරණ පනත් බ්‍රේල් මුද්‍රණයෙන් පමණක් නොව ශ්‍රව්‍ය මාධ්‍යයෙන් ද පරිශීලනය කිරීමේ අවස්ථාව ද ශ්‍රව්‍යාබාධිත සහෝදර ජනතාව සඳහා විවර වනු ඇත.

මේ වන විට 2015 මහ මැතිවරණයට අදාළ ව CMEV ආයතනය විසින් සම්පාදිත අවසන් නිරීක්ෂණ වාර්තාව ද බ්‍රේල් මාධ්‍යයෙන් මුද්‍රණය කොට ඇත.

එම අදාළ ලේඛන පරිශීලනය කිරීම සඳහා බලාපොරොත්තු වන්නේනම් කරුණාකර පහත අංකයට අමතා විස්තර ලබා ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

තාරුක කරුණාරත්න -   075-4302423/011-3010664
විද්‍යුත් ලිපිනය    -   tharuka@cpalanka.org